# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/05/68/02/84

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2020.07.27

චක්‍රලේඛ අංක : 19/2020

අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අතිරේක ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
සභාපති, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව,
සභාපති, පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**<u>රාජකාරී ලිපි ගනුදෙනු කිරීම් සම්බන්ධ ආයතන සංග්‍රහයේ විධිවිධාන</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතු නිලධාරීන් විසින් පසුගිය කාල වකවානුවේදී ලිපි ගනුදෙනු සිදුකිරීමේදී අනුගමනය කරනු ලැබූ අක්‍රමවත් ක්‍රමවේද හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් බැහැර වීම හේතුවෙන් එකී කරුණු සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන හා උපදෙස් අනුව මින් ඉදිරියට කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

02. සෑම රජයේ නිලධාරියෙකුම රාජකාරී ලිපි ගනුදෙනු කිරීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXVII වන පරිච්ඡේදයේ හා XXVIII වන පරිච්ඡේදයේ විධිවිධාන අනුගමනය කළ යුතු වේ.

03. තම පෞද්ගලික අයිතිවාසිකම් කෙරෙහි සෘජුව බලපාන ඕනෑම කරුණක් පිළිබඳව, ඉල්ලීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඕනෑම නිලධරයකුට හැකියාව පවතින අතර ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXVIII වන පරිච්ඡේදයේ 5 හා 6 වගන්ති විධිවිධාන අදාළ කරගත යුතු වේ.

04. ඒ අනුව, එවැනි ඉල්ලීමක් හෝ අභියාචනයක් ගරු අමාත්‍යතුමා වෙත හෝ ඉහළ බලධාරියකු වෙත ඉදිරිපත් කිරීමේ දී සෑම විටම ධූරාවලියට අනුකූල වන පරිදි තම ආයතනයේ අධීක්ෂණ නිලධරයා හා වෙනත් අදාළ බලධරයන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර එය අසාධු, අනිසි හෝ පරිභවාත්මක භාෂාවෙන් නොවිය යුතුවේ.

05. එසේම, විනය කරුණක් පිළිබඳ අභියාචනයක් නම් ආයතන සංග්‍රහයේ XLVIII වන පරිච්ඡේදයේ විධිවිධානයන්ට අනුකූල විය යුතු වේ.

06. උක්ත විධිවිධානයන්ගෙන් පරිබාහිරව කිසියම් නියෝජනයක් ඉදිරිපත් වුවහොත් ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXVIII වන පරිච්ඡේදයේ 6:2 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවිය හැකිය.

07. මීට අමතරව, ආණ්ඩුවේ ප්‍රතිපත්ති හෝ පරිපාලන ක්‍රියාමාර්ග හෝ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීම හා විවේචනය කිරීම, ආයතන සංග්‍රහයේ XXXI පරිච්ඡේදයේ 3 වගන්තියේ විධිවිධානයන්ට අනුකූල විය යුතු වේ.

08. එබැවින් ඉහත සඳහන් විධිවිධාන තරයේ අනුගමනය කිරීමටත් ඒ සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ, අංශයේ හෝ ශාඛාවේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීමටත් කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත :- ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය — කරු.දැ.ගැ.ස.